**පැවිදි ජීවිතයේ යාවත්කාලීන නවෝදය (DECREE ON THE UP–TO–DATE RENEWAL OF RELIGIOUS LIFE - *PERFECTAE CARITATIS*) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝගයː ඉතිහාසය අධ්‍යයන ගවේෂණයක්**

ආර්.ඒ.ඩී.එස්.ඩී. රන්දෙනි

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් නිර්දේශ කළ **පැවිදි ජීවිතයේ යාවත්කාලීන නවෝදය නම් නියෝගය** 1965 ඔක්තෝබර් 20 වන දින සම්මත විය. ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ ප්‍රාථමික මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිතයට ගෙන මෙම නියෝගය සම්පාදනයේ දී ඇති වූ වාද විවාද පිළිබඳ ඉතිහාස අධ්‍යයනයක් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි.

පැවිදි ජීවිතයේ යාවත්කාලීන නවෝදය නමැති නියෝගය මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අනුකූලව එය නූතනයට ගැළපෙන ආකාරයට සකස් කිරීමට තවමත් අපොහොසත් වී ඇත්තේ මන්ද යන්න විමසීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව යි.

මෙම ගැටලුව පිළිබඳ අධ්‍යයනයේ දී තහවුරු වූයේ ඒ ඒ පැවිදි නිකායේ ස්වභාවය අනුව එම නිකායයන් කෙසේ ගොඩ නැංවිය යුතු ද යන්න මෙම ප්‍රකාශය සඳහා පැවති විවාදයේ අවසන් භාගයේ දී ගත් තීරණ මගින් ඒ සඳහා ආරම්භයක් ගත් බව යි.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකි වේ. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පදː** පැවිදි ජීවිතය, ප්‍රතිසංස්කරණය, නිර්දේශය